# රටට සිදුකරන වැඩ කොටස ගැන සැලැස්මක් ඉදිරිපත් කර නෑ

## – මාර්තු 12 ව්‍යාපාරය

ඉන්දික හේවාවිතාරණ

එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එකතුවී වසර දෙකක් තුළ රට සංවර්ධනය කරන බවට සඳහන් කළත් පක්ෂ දෙක සන්ධානගත වී මාස දෙකක කාලයක් ගතවී ඇතත් ඉදිරි වසර දෙක තුළ රටට සිදුකරන වැඩ කොටස පිළිබඳව මෙතෙක් කිසිදු සැලැස්මක් ඉදිරිපත් කර නැතැයි මාර්තු 12 ව්‍යාපාරය සඳහන් කරයි.

දින 100 ආණ්ඩුව තුළ රටට සිදුකරන වැඩපිළිවෙළ පිළිබඳව දින වකවානු ඇතිව ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කළ බවත්, එහෙත් ඒවකට පැවැති දේශපාලන ගැටුම් නිසා ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩකටයුතු කිරීමට නොහැකිවූ බවද එම සංවිධානයේ කැඳවුම්කරු සහ පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂක රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

වර්තමාන ආණ්ඩුව තුළින් ජනතාව විශාල වෙනසක් බලාපොරොත්තු වූ බවත්, එහෙත් ගැති සංග්‍රහයන් වැනි ක්‍රියාවන් තුළින් පසුගිය ආණ්ඩුවේ සහ වර්තමාන ආණ්ඩුව වෙනසක් නොමැති බවට පසුගිය දිනවල සිදුවූ ක්‍රියා තුළින් පෙන්නුම් කරන බවද ඒ මහතා පවසා සිටියේය.

ඊයේ (14දා) පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී මේ බව සඳහන් කළ කැඳවුම්කරු වැඩිදුරටත් සඳහන් කළේ, ඉදිරි වසර දෙකක කාලය තුළ සන්ධානගත ආණ්ඩුව රට තුළ සිදුකිරීමට සැලසුම් කර තිබෙන වැඩපිළිවෙළ පිළිබඳව වහාම ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කළ යුතු බවත්ය.



එය දින වකවානු සහිතව ඉදිරිපත් කළයුතු බවත් එවිට ආණ්ඩුව පොරොන්දු වූ ආකාරයට ජනතා වැඩ කොටස් සිදුකරනවාද යන්න රටේ ජනතාවට දැනගැනීමට හැකිවන බවද හෙතෙම සඳහන් කළේය.

මීට අමතරව දින 100 ආණ්ඩුව යටතේ ජනතාවට ලබාදුන් පොරොන්දු කිහිපයකුත් ඉෂ්ට කිරීමට තිබෙන බවත්, එම පොරොන්දු ඉටුකිරීමත් වර්තමාන ආණ්ඩුව සතු කටයුත්තක් බවද රෝහණ හෙට්ටිආරච්චි මහතා අවධාරණය කළේය.